සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

**නම/විභාග අංකය :- ........................................................** **කාලය: පැය 01යි.**

සැළකිය යුතුයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) පිළිතුරුවලින් නිවරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

## I කොටස

(01) වන අසිරිය බැලූ නිලාට සිතට ප්‍රීතියක් මෙන් ම ප්‍රබෝධයක් ගෙන එන ලදී. මෙම ක්‍රියාව වඩාත් සමීප වන්නේ,
(1) අන්තර්වර්තී සන්නිවේදනයට යි. (2) අන්තර් පුද්ගල සන්නිවේදනයට යි.
(3) කණ්ඩායම් සන්නිවේදනයට යි. (4) පරිසර සන්නිවේදනයට යි.

(02) අවාචික සන්නිවේදනයට නිදසුනකි.
(1) ගීතයක් ගායනා කිරීම. (2) ධර්ම දේශනාවක් පැවැත්වීම.
(3) පුවත්පතක ශීර්ෂ පාඨය. (4) හෝඩියක අකුරු කියවීම.

(03) විනිවිදක රූපරාමු යොදාගන්නා ප්‍රක්ෂේපණ යන්ත්‍රය,
(1) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය (2) කඳා ප්‍රක්ෂේපණ යන්ත්‍රය
(3) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය. (4) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය

(04) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ මූල්‍ය හා පාලක ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගනු ලබන්නේ,
(1) සභාපති හා කොටස් කරුවන්ය. (2) සභාපති හා අධ්‍යක්ෂවරුන් ය.
(3) අධ්‍යක්ෂ ජනරාල් හා සාමාන්‍යාධිකාරීය. (4) සභාපති හා ප්‍රධාන විධායකය.

(05) ස්ත්‍රී - පුරුෂ භාවය නම් සංකල්පය,
(1) සම්ප්‍රදායික සමාජයට උචිත සංකල්පයකි. (2) දේශපාලනික සමාජය උචිත සංකල්පයකි.
(3) මනෝවිද්‍යාත්මක සිතුවිල්ලකට උචිත සංකල්පයකි. (4) සංවර්ධිත සමාජයකට උචිත සංකල්පයකි.

(06) ඡායාරූපයක අනාවරණ ක්‍රියාවලියේ දී ආලෝකය පාලනය කිරීම සම්බන්ධව මූලික වශයෙන් බලපාන්නේ,
(1) කැමරා කෝණය (2) ක්ෂේත්‍ර ගැඹුර (3) රූප සංරචනය (4) ද්වාර වේගය

(07) සන්නිවේදන පර්යේෂණයකට තොරතුරු රැස්කිරීමට පෙර විද්‍යාර්ථයින් අමතා උපදේශක තුමා ලබාදුන් උපදෙස් කීපයක් පහත දැක්වේ.

A - තියුණු නිරීක්ෂණයක් මෙන් ම විචක්ෂණශීලී වීම. අනිවාර්ය වේ.

B - කාල කළමනාකරණයකින් සෑම විට ම කටයුතු කරන්න.

C - තොරතුරුවල නිෂ්චිත බව ගැන සැලකිලිමත් වන්න.

D - දත්ත දායකයා සමඟ හෘදයාංගම සම්බන්ධතාවයක් ඇති කර ගන්න.

මේ අතුරින් විද්‍යාත්මකව පිළිගතහැකි උපදෙස් වනුයේ,

(1) A හා B පමණි (2) B හා C පමණි (3) AB හා D පමණි (4) AB හා CD පමණි

(08) පහත ප්‍රකාශ අතරින් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) පොතක ISBN අංකය මගින් එය දේශීය වශයෙන් පිළිගැනීමට ලක්වනු ඇත.

(2) ශ්‍රී ලංකාවේ පළවූ ප්‍රථම දෙමළ පුවත්පත උදායි තාරකෛයි ය.

(3) සඟරාවක කෙටි ලිපි හා රූපසටහන් ඇතුළත්ව තිබිය හැකි ය.

(4) ප්‍රදේශීයතාවය අනුව ද පුවත්පත් වර්ගීකරණයට ලක් කර ඇත.

(09) පුවත්පත් ගණනාවක් ප්‍රකාශ කරන ලංකාදීප වැනි ආයතනයක සංස්කාරක සම්බන්ධව පිළිගතහැකි වගන්තිය තෝරන්න.

(1) කර්තෘ මණ්ඩල උපදේශකයන් ප්‍රධාන සංස්කාරකට වඩා පහළින් සිට උපදෙස් ලබා දෙනු ඇත.

(2) පළවන සියලුම පුවත්පත් පාලනය කරන්නේ සංස්කාරක කතුවරයෙක් මගිනි.

(3) සියලු සංස්කාරක කතෘවරුන් පාලනය කරන්නේ පරිපාලන සංස්කාරක කර්තෘවරයෙක් මගිනි.


(4) ඉහත පුවත්පත් ආයතනයට උපකතුවරුන්ගේ සේවය අවශ්‍ය නොවනු ඇත.

(10) චීනයේ සොයාගත් මුද්‍රණ ශිල්පය නවීකරණය කරන ලද්දේ,

(1) සැමුවෙල් මෝස් විසිනි. (2) ගුටෙන්බර්ග් විසිනි.

(3) ජොහැනස්රෝස් විසිනි. (4) විල්බර්ශ්‍රාම් විසිනි.

(11) පහත දක්වා ඇත්තේ එක්තරා අවිධිමත් සන්නිවේදන ආකෘතියක රූප සටහනකි.




මෙහි තොරතුරු හුවමාරුව සිදු වන්නේ,

(1) එක් අයෙකුගෙන් තවත් අයෙකුට වශයෙන් පිළිවෙළකට තොරතුරු පැතිරයාමයි.

(2) එක් අයෙකුට ලැබෙන තොරතුරු අනෙකාට ප්‍රවේශ කිරීමක් වශයෙනි.

(3) පණිවිඩය පැතිරවීම අවශ්‍ය පිරිසක් හරහා සිදු වීමක් වශයෙනි.

(4) ආරම්භකයා තමා විසින් තෝරා ගන්නා ලද කිහිපදෙනෙකුට පමණක් පණිවිඩ ලබා දීමක් වශයෙනි.

(12) පිටු පෙරලනය නම් ප්‍රක්ෂේපණය නොවන උපකරණය පිළිබඳ පහත ප්‍රකාශ නිරීක්ෂණය කරන්න.

A - පිටු පෙරලනය වූ කලී පෙර සූදානමක් අවශ්‍ය මාධ්‍ය උපකරණයකි.

B - පිටු පෙරලනයේ සන්නිවේදනයට අක්ෂර පමණක් භාවිත කරයි.

C - පිටු පෙරලනයේ ලියනු ලබන වාක්‍ය කෙටි විය යුතු ය.

මේ අතුරින් සත්‍ය වනුයේ,

(1) A හා B ගේ ප්‍රකාශ පමණි. (2) B හා C ගේ ප්‍රකාශ පමණි.

(3) A හා C ගේ ප්‍රකාශ පමණි. (4) සියලු දෙනා නිවැරදිව අදහස් ප්‍රකාශ කර ඇත.

(13) පැලියොලිතික් යුගයේ මානවයා සන්නිවේදනයට යොදා ගත්තේ,

(1) ශබ්ද - ඉරියව් හා ඉඟිය. (2) ජනමාධ්‍යය

(3) ගැමි සන්නිවේදන මාධ්‍යය. (4) බෙරහඬ, ගින්දර, ගස්වල අතු ය.

(14) පුරවැසිභාවය බිඳ වැටීමට බලපාන සාධකයකි.

(1) සමානාත්මකතා පදනමක් හැමවිටම අනුගමනය කිරීම.

(2) වාර්ගික අභිමානය අනුව කටයුතු කිරීම.

(3) නීතියට අනුකූලව කටයුතු කිරීම.

(4) සියලු සමාජ සංස්ථාවන් තුළ අභිමානයෙන් කටයුතු කිරීම.

(15) පුවත්පත් නිර්මාණයට අයත් මූලික පියවර අනුපිළිවෙලින් දැක්වෙන්නේ,

(1) තොරතුරු රැස් කිරීම, වර්ගීකරණය, පුවත් රචනය, භාෂා සංස්කරණය.

(2) පුවත්පත් ප්‍රකාශයට පත් කිරීම, පිටු සැකසීම, සෝදුපත් කියවීම.

(3) පරිගණක අක්ෂර සංයෝජනය, තොරතුරු එක්රැස් කිරීම.පුවත් රචනය.

(4) භාෂා සංස්කරණය, ප්‍රවෘත්ති රචනය, සෝදුපත් කියවීම, පිටු සැකසීම.

(16) ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය ආරම්භ වන්නේ,

(1) පෘතුගීසී පාලන සමයේ දී ය. (2) ඉංග්‍රීසි පාලන සමයේ දී ය.

(3) ලන්දේසි පාලන සමයේ දී ය. (4) පශ්චාත් යටත් විජිත පාලන සමයේ දී ය.

(17) සමූහ සන්නිවේදන උපක්‍රම භාවිත කර ගැටලුවක් නිරාකරණයේ දී වඩාත් සාධාරණව එම ක්‍රියාව සිදු කිරීමට අනුගමනය කළ යුතු පියවර පහත දැක්වේ.

A - සියලුදෙනාට අදහස් දැක්වීමට අවස්ථාව දීම.

B - විකල්පවලට ඉඩකඩ ලබා දීම.

C - අවසාන තීරණයට සාමූහිකව වගකීම.

D - තීරණ ගැනීමට සියල්ලම සහභාගී කරවා ගැනීම.

E - සුළුතරයේ අදහස් අවධානයට ගැනීම.

මෙම පියවරයන්හි නිවැරදි අනුපිළිවෙල වන්නේ,

(1) ADBEC (2) DABEC (3) BEDCA (4) DABCE

(18) විවිධ හැඩතල සුමට තලයක් මත ගොඩනැගීමට ගුරුවරයාට අවශ්‍ය විය. එහි දී භාවිත කළ යුතු වන්නේ,

(1) පිටු පෙරලනය. (2) අන්තර්ක්‍රියාකාරී පුවරුව

(3) පත්‍රිකා ලැල්ල. (4) කාන්දම් පුවරුව.

(19) මාධ්‍ය නියෝජනය සම්බන්ධව **නිරවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) පවුලක කාර්යයන් සමාලෝචනය කිරීමට ජනමාධ්‍යවලට හැකියාවක් නැත.

(2) වාර්ගික අසමානතා සඳහා ජනතාව පොළඹවා ලීමට ඇති ප්‍රබලම උපකරණය ජනමාධ්‍ය වනු ඇත.

(3) සමාජ ප්‍රතිරූප නිර්මාණය මෙන් ම බිඳදැමීම වර්තමානයේ සිදු කරණුයේ ජනමාධ්‍යයි.

(4) විශ්වීය සාරධර්ම ආගන්තුක සංස්කෘතීන්වලට ප්‍රක්ෂේපණය කිරීමේ ප්‍රධාන වාහකයා ජනමාධ්‍යයි.

(20) ''හැම උද්වේගකර ආරංචියක් ම ප්‍රවෘත්තියකි.'' .... මෙම අර්ථ දැක්වීමට සිදු කරනු ලැබුවේ,

(1) මිල්ටන් බුෂ්ය. (2) චාර්ල්ස් ඇන්ඩර්සන් ඩාතාය.

(3) පෝල් ඩී මැසිනියර්ය. (4) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයයි.

(21) විද්‍යුත් පුවත්පත්වල පොදු ලක්ෂණයක් **නොවන්නේ,**

(1) ක්ෂණිකව පුවත් දැන ගැනීමේ හැකියාව. (2) නැවත නැවත කියවිය හැකි වීම.

(3) ක්ෂණික පාඨක ප්‍රතිචාර ලබා ගැනීම. (4) ගබඩාකර තබා ගැනීමේ අපහසුතාව.

(22) ලිඛිත සන්නිවේදනයේ සිද්ධාන්ත හා **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

(1) ලේඛනය මගින් භාෂාවේ දෘශ්‍ය ස්වරූපය ප්‍රදර්ශනය කරයි.

(2) විරාම ලක්ෂණ, අක්ෂර වින්‍යාසය බහුලවම භාවිත කරයි.

(3) නිරවුල් බව, පැහැදිලි බව එතරම් අවශ්‍යතාවක් ඇති නොකරයි.

(4) පුවත්පත්, ග්‍රන්ථ, වාර්තා, ලිපිවල බහුලව භාවිත කරයි.

(23) මැජික් ලැන්තෑරුම නම් ප්‍රථම ප්‍රක්ෂේපණ උපකරණය සොයාගත්තේ,

(1) ජොහැන්ස් ගුටෙන්බර්ග්ය. (2) ඇතනේසියස් ක්රේචර්ය.

(3) ඇලෝසියස් සෙනෙහෙෆෙල්ඩර්ය. (4) එඩ්වඩ් මයේ බ්‍රිජ්ය.

(24) ජනමාධ්‍ය සම්බන්ධයෙන් රජයේ බලපෑම පිළිබඳව මාධ්‍යවේදීන් සිව් දෙනෙක් රූපවාහිනී නාලිකාවක් අමතා කළ ප්‍රකාශ හතරක් පහත දැක්වේ.

A - විදුලි සංදේශ නියාමන කොමිසම මගින් විද්‍යුත් මාධ්‍ය නාලිකා ආරම්භ කිරීමට බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය කර තිබෙනවා.

B - ජාතික ආරක්ෂාව ප්‍රශ්නයක් කරගෙන මාධ්‍ය ආයතන රජයට පවරා ගැනීමක් මෙහිදී සිදු විය හැක.

C - මාධ්‍යවේදීන්ට ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දී එමගින් මාධ්‍ය පාලනය කිරීමක් රජය සිදු කරනවා.

D - මාධ්‍ය ක්‍රියාකරුවන්ට විශේෂ පහසුකම් ලබා දී රජය මාධ්‍යවේදීන් පාලනය කරනවා.

මේ අතුරින් රජය වක්‍රව ජනමාධ්‍ය පාලනය කරන අවස්ථා ප්‍රකාශ කර ඇත්තේ,

(1) A හා B පමණි (2) A හා D පමණි (3) B හා C පමණි (4) C හා D පමණි

(25) එක් ආරම්භක ස්ථානයකින් වැඩි ගමනාන්ත සංඛ්‍යාවක් වෙත සන්දේශයක් යැවීමට භාවිත කළ යුත්තේ,

(1) ස්ථාවර දුරකථනය මගිනි. (2) Fax යන්ත්‍රය මගිනි.

(3) පේජරය මගිනි. (4) පියවූ පරිපථ කැමරාව මගිනි.

(26) වැඩලෝකය විවිධ වෘත්තීන්, සංවර්ධන ක්‍රියාවලි සහ වෙළඳපොල බලවේග සමග එක් වී ඇත. මේ නිසා වැඩ ලෝකයට ලැබී ඇති ප්‍රමුඛ ලක්ෂණය වන්නේ,

(1) ගතික වීමය. (2) සාම්ප්‍රදායික වීමයි.

(3) මනඃකල්පිත වීමය. (4) ව්‍යාපාර ආධිපත්‍යයට යටත් වීමය.

(27) රූප සංරචනය තුළ සිදු වන්නේ,

(1) රූප එකතු වී තිබීමයි.

(2) රූප රාමුව තුළ අඩංගු වස්තූන් නිසි පරිදි සංවිධානය වී තිබීමයි.

(3) රූපරාමුව තුළට ආලෝකය නිසි පරිදි විසරණය වී තිබීමයි.

(4) නාභිගත කිරීම තුළින් රූප හා වස්තු අතර සම්බන්ධීකරණයක් ඇති වී තිබීමයි.

(28) G. ඇක්ලන්ඩ් හා E. ඩාර්ලි යන දෙදෙනා සංස්කරණය කළ පුවත්පත් යුගලය වන්නේ

(1) දිනමිණ හා සිළුමිණ ය. (2) කවට කතිකයා හා ලංකෝපකාර ය.

(3) ඥානාර්ථ ප්‍රදීපය හා සිංහල බෞද්ධයා ය. (4) ඔබ්සර්වර් හා කොමර්ෂල් ඇඩ්වර්ටයිසර් ය.

(29) සත්ත්ව සන්නිවේදනය වැඩි වශයෙන්ම භාවිත කරන්නේ,

(1) ප්‍රවාහනය සඳහා ය. (2) තොරතුරු නිර්මාණය කිරීමට ය.

(3) ආරක්ෂාව හා ප්‍රජනක කාර්‍යය සඳහා ය. (4) ශිෂ්ටාචාර ගොඩනගා ගැනීමට ය.

(30) පාසලේ උදෑසන ගුවන්විදුලි විකාශයට ඉදිරිපත් කිරීමට දිදුලංග විසින් සැකසූ ප්‍රවෘත්තියක පහත අංග ජනමාධ්‍ය සමාජය භාර ගුරුතුමාගේ නිරීක්ෂණයට ලක් විය.

A - කෙටි වාක්‍යවලින් රචනා වීම.

B - සිදුවීම පිළිබඳ අතිශයොක්ති තිබීම.

C - සංඛ්‍යා ලේඛන හතරක් ඇතුළත්ව තිබීම.

D - යටිකුරු පිරමීඩ න්‍යාය අනුගමනය කර තිබීම.

ඉහත ලක්ෂණවලින් ගුරුතුමා ඉවත් කළ හැකි අංග විය හැක්කේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) A,C හා D ය. (4) A,B,C හා D ය.

(31) ග්‍රාහකයාගේ ආකල්ප හා චර්යා වෙනස් කිරීමටම සන්නිවේදනය භාවිත කළ යුතුය....... මෙම අදහස වඩාත් තහවුරු කරන සන්නිවේදන නිර්වචනය ඉදිරිපත් කළේ,

(1) විල්බර්ශ්‍රම් ය. (2) වෝල්ටර් ලිප්මාන්ය. (3) එඩ්වඩ් ෂැපීර්ය. (4) හැරල්ඩ් ඩී ලැස්වෙල්ය.

(32) ලේඛනයක පරිගණක අක්ෂර සංයෝජන දෝෂ තිබීම, කලු පාට පැල්ලම් මුද්‍රණය වී තිබීම,

(1) මාධ්‍ය බාධාවකි. (2) අර්ථ බාධාවකි.

(3) පාරිසරික බාධාවකි. (4) ශාරීරික හා මානසික බාධාවකි.

(33) මානවයා සිය හැඟීම් - සිතුවිලි අනෙකාට ප්‍රකාශනය සඳහා යොදාගන්නා ප්‍රධාන ම සන්නිවේදන මූලිකාංගය වන්නේ,

(1) ආකේතකරය නම් වේ. (2) සන්දේශය නම් වේ. (3) ග්‍රාහකයා නම් වේ. (4) සන්දර්භය නම් වේ.

(34) ධාරා සටහන් (Flow Charts) අයත් වන්නේ,

(1) ශ්‍රව්‍ය සන්නිවේදනයටයි. (2) අවිධිමත් සන්නිවේදනයටයි.

(3) රූප සන්නිවේදනයටයි. (4) රූපණ සන්නිවේදනයටයි.

(35) ස්වභාවික පරිසරයේ හමුවන වස්තුවල සමීප ඡායාරූප ගැනීමට භාවිත කළ යුතු කාච වර්ගය වන්නේ,

(1) යුහුමු කාචය යි. (2) උත්තල කාචය යි.

(3) පුලුල් කෝණ කාචය යි. (4) පටු කෝණ කාචය යි.

(36) ලෝකයේ ප්‍රථමවරට විධිමත්ව ගුවන්විදුලි වැඩසටහනක් ඉදිරිපත් කළේ,

(1) රුසියාවේ පිටර්ස්බර්ග් විශ්ව විද්‍යාලය යි. (2) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලය යි.

(3) ඇමරිකාවේ ඉලිනෝයි විශ්ව විද්‍යාලය යි. (4) ඉතාලි රාජ්‍ය විශ්ව විද්‍යාලය යි.

(37) මෘදු පුවත්,

(1) වැඩි දෙනෙකුට බලපෑම් ඇතිකරන අතර නිර්මාණශීලී භාෂාවක් යොදා ගනී.

(2) කාලීන තොරතුරු ඉදිරිපත් කරන අතර බොහෝ විට මුල් පිටුවේ පළ කෙරේ.

(3) වැඩි දෙනෙකුගේ අවධානය දිනා ගන්නා හැඟීම්වලට ආමන්ත්‍රණය කරයි.

(4) ඇතුළු පිටුවල බොහෝ විට පළවන අතර ජාතික වැදගත්කමකින් යුක්ත වේ.

(38) මියගිය ඇතින්නකින් කිරි උරාබොන කුඩා අලි පැටියකුගේ ඡායාරූපයක් පුවත්පතේ ප්‍රධාන කතුවරයාට ලැබී ඇතැයි සිතන්න. එය පළ කිරීමට වඩාත් සුදුසු වන්නේ,

(1) නිර්මාණාත්මක ඡායාරූපයක් වශයෙනි.

(2) විශේෂාංග ඡායාරූපයක් වශයෙනි.

(3) දැන්වීම් ඡායාරූපයක් වශයෙනි.

(4) සිහිවටන ඡායාරූපයක් වශයෙනි.

(39) ඔබ බිත්ති පුවත්පතකට නිර්මාණාත්මක රචනාවක් කරන විට එහි උච්චතම අවස්ථාව ලියා දක්වන්නේ,

(1) හැඳින් වීම තුළය.

(2) සිද්ධිය තුළය.

(3) තොරතුරු පරිශ්‍රය තුළ ය.

(4) නිගමනය හා අවසානය තුළ ය.

(40) පන්තිකාමර ඉගැන්වීමෙහි යෙදී සිටින ගුරුතුමා රූපසටහනක් අඳිමින් ඒවා විස්තර කරයි. සිසුහු ඒවා අසමින් සටහන් ලියා ගනිති. මේ අවස්ථාවේ සිදුවන සන්නිවේදන ස්වරූපවල අනුපිළිවෙළ විය හැක්කේ,

(1) දෘශ්‍ය - ශ්‍රව්‍ය - වාචික හා ලිඛිත සන්නිවේදනයයි.

(2) ලිඛිත - වාචික - ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනයයි.

(3) දෘශ්‍ය - වාචික - ශ්‍රව්‍ය හා ලිඛිත සන්නිවේදනයයි.

(4) ලිඛිත - දෘශ්‍ය - වාචික හා ශ්‍රව්‍ය සන්නිවේදනයයි.

(ලකුණු 1 × 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

නම/විභාග අංකය :- ........................................................... කාලය: පැය 02යි.

## II කොටස

- පළමුවන ප්‍රශ්ණය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- පළමු වැනි ප්‍රශ්ණයට ලකුණු 20ක් හිමිවන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

(01) කෙටි පිළිතුරු සපයන්න.

''වරාය නගරයේ එක් රැයක් ගත කළෙමි'' ......... මැයින් වසන්ත ලියූ රචනාව ''සත්‍රා'' නම් විද්‍යුත් පුවත්පතේ පළව ඇති බව සමීප මිත්‍රයෙකු පන්තියේ සෙසු මිත්‍රයින්ට ප්‍රකාශ කළේ ය.

(1) මිතුරන් දෙදෙනා කතා කිරීම අයත්වන සන්නිවේදන වර්ගය නම් කරන්න.

(2) විද්‍යුත් පුවත්පතේ පළවූ ලිපිය ඵලදායි ලේඛනයකි. ඵලදායී ලේඛණයක දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** සඳහන් රන්න.

(3) රචනාවේ අඩංගු වූයේ ලිඛිත භාෂාවයි. වාචික බසට වඩා ලිඛිත බස විධිමත් වීමට හේතු **දෙකක්** ලියා දක්වන්න.

(4) ''වරාය'' විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන ස්ථානයක් බවට වූ සාක්ෂි **දෙකක්** ඉදිරිපත් කරන්න.

(5) වසන්තගේ රචනය විද්‍යුත් පුවත්පතට ඉදිරිපත් කිරීමට පෙර DTP ක්‍රියාවලියට යොමු කළේය. DTP ක්‍රියාවලියේ වාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(6) ''සත්‍රා'' නම් විද්‍යුත් පුවත්පත සතු විශේෂ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(7) ඉහත රචනය සමඟ ප්‍රවෘත්ති ඡායාරූපයක් ද පළවිය. ප්‍රවෘත්ති ඡායා රූපය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(8) වසන්තගේ නිර්මාණාත්මක චින්තනය සංවර්ධනයට මෙවැනි රචනා හේතුවන ආකාරයක් පෙන්වා දෙන්න.

(9) වරාය නගරය විවෘත්ත කිරීම දෘඪ පුවතක් වූ ආකාරයක් කෙටියෙන් ලියා දක්වන්න.

(10)වසන්තට ඉහත රචනය ලිවීමේ දී වැදගත් වූයේ යැයි සිතිය හැකි තොරතුරු මූලාශ්‍ර **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) S → M → C → R → E

ඉහතින් දක්වා ඇත්තේ එක්තරා සන්නිවේදන ක්‍රියාවලියක ආකෘතියක් බව උපකල්පනය කරන්න. එය ආශ්‍රය කරගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ඕනෑම සන්නිවේදන ක්‍රියාවලියක අන්තර්ගතය දැක්වෙන සන්නිවේදන මූලිකාංගය නම් කරන්න.

(ලකුණු 01)

(2) ඉහත සන්නිවේදන ක්‍රියාවලිය ඒක මාර්ගික බව පෙන්වීමට සාධකයක් ලියා දක්වන්න. එහි ඇති අවාසියක් ද සඳහන් කරන්න. (ලකුණු 02)

(3) ''බලපෑම **(E)** '' වැදගත් සන්නිවේදන මූලිකාංගයක් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 03)

(4) ගුවන් විදුලි ප්‍රවෘත්ති වැඩසටහනකින් හා සරල ගී වැඩසටහනකින් ඉටු කරගැනීමට බලාපොරොත්තු වන ප්‍රධාන සන්නිවේදන අරමුණු **දෙකක්** වෙන වෙනම විස්තර කරන්න. (ලකුණු 04)

(03) අමරා තම පාසල් මිතුරියක් වන ලක්ෂ්මී අමතා ඊයේ දිනයේ ඉගැන්වූ සමූහ සන්නිවේදන පාඩම් සටහන විද්‍යුත් තැපැල් මගින් තම වෙබ් අඩවියට ගෙන්වා ගත්තේ ය.

(1) සමූහ සන්නිවේදන ක්‍රියාවලියේ දී සමූහය හා ඉදිරිපත් කරන්නා අතර සම්බන්ධය ගොඩනැංවීමට යොදා ගත හැකි සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 01)

(2) අමරා සාමාන්‍ය තැපැලට වඩා විද්‍යුත් තැපැල භාවිත කිරීමෙන් ලැබුණු වාසි **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(3) ලක්ෂ්මී එවූ සටහනේ බොහෝ ස්ථාන සංජානනය කර ගැනීමට අමරාට නොහැකි විය. මෙසේ වීමට බලපෑ හේතු සාධක තුනක් ලියන්න. (ලකුණු 03)

(4) ''විද්‍යාර්ථයෙක් ඉගෙනීමට සාමාන්‍ය සටහන් පොතක් භාවිතා කරනවාට වඩා පෞද්ගලිකව වෙබ් අඩවියක් පවත්වා ගෙන යමින් එම කාර්ය කිරීම වඩා වාසි දායකය...... '' ඔබ මේ ප්‍රකාශය හා එකඟ වේද? හේතු හතරක් දෙමින් විස්තර කරන්න. (ලකුණු 04)

(04) පුවත්පත්වල විශේෂාංග ලිපි වලින් පවුල නියෝජනය කරන ආකාරය ගැන සා.පෙළ සිසු පිරිසක් සමීක්ෂණයක යෙදුනේය.

(1) පවුල් සංස්ථාව හැර ජනමාධ්‍ය සමාජීය නියෝජන අධ්‍යයනය කළ හැකි ක්ෂේත්‍ර **දෙකක්** නම්කරන්න. (ලකුණු 01)

(2) පුරවැසිභාවය ප්‍රදර්ශනය පවුල් සංස්ථාවේ දියුණුවට බලපාන ආකාර **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(3) පුවත්පත්වල පැවැත්මට විශේෂාංග ලිපිවලින් සිදු කරන කාර්යයන් තුනක් සවිස්තරව දක්වන්න. (ලකුණු 03)

(4) ''ජනමාධ්‍ය වර්තමාන පවුල් සංස්ථාවේ සංස්කෘතිය ප්‍රබල ලෙස වෙනස් කිරීමට දායක වී ඇත..... '' යන තේමාව යටතේ සති අන්ත පුවත්පතකට වචන **100කට** නොඅඩු විශේෂාංග ලිපියක් කරුණු **හතරක්** ඇසුරු කරගෙන රචනා කරන්න. (ලකුණු 04)

(05) (1) සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 01)

(2) තොරතුරුවළ ගුණාත්මක භාවය රඳාපවතින සාධක **දෙකක්** පෙන්වා දෙන්න. (ලකුණු 02)

(3) දොරටුපාල සංකල්පය අනුගමනය කිරීමෙන් ලැබෙන වාසි **දෙකක්** හා **අවාසියක්** වෙන වෙනම පහදන්න. (ලකුණු 03)

(4) ජනමාධ්‍යයට තොරතුරු වාර්තාවක් ඉදිරිපත් කිරීමේදී මාධ්‍යවේදියා සැලකිය යුතු සාධක **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04)

(06) මහජනතාවට තොරතුරු ලබා දීමේ ක්‍රියාවලියේ දී පුවත්පතට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.

(1) ''**පුවත්පත**'' යන්න අර්ථ දක්වන්න. (ලකුණු 01)

(2) ඡායාරූප ශිල්පියකු සැලසුම් කරන ලද ඡායාරූප පුවත්පත වෙනුවෙන් යොදා ගන්නා විට **පැහැ අන්තරය** නම් මූල ධර්මය භාවිතා කළ යුතු ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 02)

(3) පුවත්පත් වර්ගීකරණයට ලක්වන ආකාරයන් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 03)

(4) පුවත්පතට තොරතුරු රැස්කිරීමේ දී භාවිත ශිල්පීය ක්‍රම **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04)

(07) පාසල් මාධ්‍ය සමාජය ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියක වාර්තාව එහි ලේකම් තුමා මහා සභාවට ඉදිරිපත් කළ අතර, ලියාපදිංචි තැපෑලෙන් එහි පිටපතක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට යවන ලදී.

(1) ''වාර්තාව'' යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 01)

(2) කාර්යාලයට ලැබෙන ලිපියක් සම්බන්ධ මාධ්‍ය ක්‍රියාවලියේ ඕනෑම පියවර **හතරක්** කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 02)

(3) ලේකම් තුමා ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය භාවිත කරමිනි. එවැනි උපකරණ භාවිතයේ වාසි **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 03)

(4) ඉහත ව්‍යාපෘති වාර්තාවෙන් තොරතුරු රාශියක් සමාජගත විය. තොරතුරු දැනගැනීමේ ප්‍රධාන අවශ්‍යතා **දෙකක්** නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 04)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 1 | (11) | 1 | (21) | 4 | (31) | 4 |
| (02) | 3 | (12) | 3 | (22) | 3 | (32) | 1 |
| (03) | 2 | (13) | 1 | (23) | 2 | (33) | 2 |
| (04) | 2 | (14) | 2 | (24) | 4 | (34) | 3 |
| (05) | 4 | (15) | 1 | (25) | 3 | (35) | 4 |
| (06) | 4 | (16) | 3 | (26) | 1 | (36) | 1 |
| (07) | 4 | (17) | 1 | (27) | 2 | (37) | 3 |
| (08) | 1 | (18) | 4 | (28) | 4 | (38) | 2 |
| (09) | 3 | (19) | 2 | (29) | 3 | (39) | 4 |
| (10) | 2 | (20) | 1 | (30) | 2 | (40) | 3 |

(ලකුණු 1 × 40 = 40)

ලකුණු බෙදී යන ආකාරය

**(I)** පත්‍රය = ලකුණු 1 × 40 = 40

**(II)** පත්‍රය (01) ප්‍රශ්නය අනිවාර්ය = 20
(02) - (07) දක්වා (10 × 4) = 40 } 60

( I + II ) = 40 + 60
අවසාන ලකුණු = 100%

### II කොටස

- **පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **ප්‍රළමු වන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10ක් බැගින් හිමිවේ.**

(01) (1) පුද්ගලාන්තර සන්නිවේදනය (ලකුණු 02)

(2) නිරවුල්ව/ පැහැදිලි බව/ උචිත ආකෘතිය භාවිතය/ නිර්මාණශීලීත්වය/ සම්මත ව්‍යාකරණ විධි භාවිතය/ විරාම ලක්ෂණ හා පද සාධනය භාවිතාය / ඡේද වෙන් කිරීම. (ලකුණු 02)

(3) ව්‍යාකරණ තිබීම/ අක්ෂ වින්‍යාසය තිබීම/ අකුරු වල හැඩයක් තිබීම/ විරාම ලක්ෂණ තිබීම/ වචන ඇත්කිරීම/ වාක්‍ය වෙන් කිරීම/ ඡේද වෙන් කිරීම (ලකුණු 02)

(4) නීති පද්ධතියක් ක්‍රියාත්මකවීම/ පරිපාලන ක්‍රමවේදයක් තිබීම... යන සාධක දෙකට අයත්වන ඕනෑම පිළිතුරු දෙකක් ලිවීම. (ලකුණු 02)

(5) අඩු පිරිවැය/ ආකර්ෂණීය නිමාව/ ඉක්මන් බව/ පහසුව/ කාර්යක්ෂමතාව (ලකුණු 02)

(6) ක්ෂණිකව පුවත් දැනගැනීමේ හැකියාව/ ගබඩා කර තබා ගැනීමේ පහසුව/ නැවත නැවත කියවිය හැකි වීම/ තොරතුරු විෂය අනුව වර්ග කරමින් පළ කිරීම/ යාවත්කාලීන කිරීම පහසුව/ ක්ෂණික පාඨක ප්‍රතිචාර ලැබීම. (ලකුණු 02)

(7) ප්‍රවෘත්තිමය වටිනාකමකින්/ ප්‍රවෘත්තිමය ගුණාංග සහිත ඡායාරූපය (ලකුණු 02)

(8) පරිකල්පනය වර්ධනයට/ ඵලදායී ආඛ්‍යාන තෝරා ගැනීමට පෙළඹීමට/ අපූර්ව බව මැවීමට හුරුවීම/ නවීකරණයට යොමුවීමට/ නවෝත්පාදනයට යොමුවීමට (ලකුණු 02)

(9) විශාල පිරිසකගේ අවධානය දිනා ගැනීම/ ජාතික හෝ ජාත්‍යන්තර පිළිගැනීමක් සහිතවීම/ කාලීන වටිනාකමක් තිබීම. (ලකුණු 02)

(10) පුද්ගල / ආයතනික / ලිඛිත / මාධ්‍ය මූලාශ්‍ර (ලකුණු 02)

(02) (1) සංදේශය / පණිවුඩට / Ⓜ සංකේතය දැක්වීම. (ලකුණු 01)

(2) සන්නිවේදනය එකම දිශාවට ගලායාම/ ඒකාධිපති විම/ ප්‍රතිපෝෂණය නොලැබීම/ සංදේශය ලැබීම නිශ්චිත නොවීම/ ග්‍රාහක අවබෝධය දුර්වලවීම. (ලකුණු 1x2=2)

(3) ග්‍රාහකයාගේ චර්යාව හා ආකල්ප වෙනස් වීම/ ග්‍රාහකයා ® සන්නිවේදකයාට නතු කිරීමට හැකිවීම/ අපේක්ෂා නොකළ ප්‍රතිඵල ද ඇතිවිය හැක. (ලකුණු 03)

(4) තොරතුරු සම්පාදනය, අධ්‍යාපනය / දැනුම = ප්‍රවෘත්ති වැඩසටහන
විනෝදාස්වාදය = ගීතවැඩසටහන (ලකුණු 04)

(03) (1) ග්‍රාහක අරමුණු හා අපේක්ෂාවලට කථා කිරීම/ ග්‍රාහක සාක්ෂරතා මට්ටමට උචිත ආකාරයට සන්නිවේදනය / ග්‍රාහක අත්දැකීම් පසුතලය හා ගැලපීම/ කථිකයාගේ කථන දක්ෂතාව/ යොදාගන්නා මාධ්‍ය උපකරණ / කථකයාගේ අවාචික ඉරියව් භාවිතයේ සඵලතාව/ ග්‍රාහකයන්ට ප්‍රතිචාර දැක්වීමට සපයා ඇති පහසුකම (ලකුණු 01)

(2) වේගවත් සන්නිවේදනයට/ ලිපිය රඳවා ගැනීමේ පහසුකම / ඡායාරූප - සංගීත ඛණ්ඩ යැවීමට හැකිවීම/ ලිපිවල පිටපත් ගබඩාකර ගත හැකිවීම/ අනවශ්‍ය දෑ පහසුවෙන් ඉවත් කිරීමට හැකිවීම (ලකුණු 02)

(03) සන්දේශය තුළ විවිධාර්ථ තිබීම/ වැරදි ලෙස තොරතුරු ගොනුවී සංදේශය සැකසීම/ සන්දේශයේ තොරතුරු විකෘති වීම/ ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලය හා නොගැළපීම. (ලකුණු 03)

(4) එකඟවේ. (එකඟවීමට පමණක් ලකුණු හිමිවේ.) තොරතුරු ග්‍රහණය පහසුය / තොරතුරු යාවත්කාලීන කිරීම පහසුය / සමාජයට පහසුවෙන් විවෘතකළ හැකිවීම/ තොරතුරු විධිමත් හා ආකර්ෂණීයව පිළියෙළ කිරීමට හැකිවීම/ තොරතුරු වේගවත්ව නිකුත් කිරීමට හැකිවීම/ ප්‍රතිචාර වේගවත්ව ලබාගැනීමට හැකිවීම. (ලකුණු 04)

(04) (1) ස්ත්‍රී පුරුෂ සමාජ භාවය/ වාර්ගිකත්වය/ පුරවැසි භාවය/ මානව හිමිකම් හා වගකීම් (ලකුණු 01)

(2) ප්‍රජාතන්ත්‍රවාදීව ප්‍රශ්න විසඳාගැනීමට ක්‍රියා කිරීම/ නීතිගරුකවීම/ පවුලේ සුභ සාධනයට කැපවීම/ සමාජිකයන්ට ගරු කිරීම/ පවුල ගැන අභිමානයෙන් සිටීම/ ආචාරශීලීවීම/ සංස්කෘතිය ආරක්ෂා කිරීම/ ගුණගරුකවීම/ පවුල තුළ යහපත් ලෙස ජීවත්වීමට උත්සහ ගැනීම. (ලකුණු 02)

(3) ග්‍රාහක ආකර්ෂණයට / පුවත්පතට විවිධත්වයක් ලබාදීමට / මාධ්‍ය නියෝජනය අර්ථවත් කිරීමට/ පුවත්පතේ නිර්මාණාත්මක බව වැඩි කිරීමට/ පුවත්පතේ ප්‍රමිතිය සංවර්ධනයට (ලකුණු 03)

(4) දෛනික ජීවිතය වෙනස් කිරීම/ පාරිභෝජන රටා වෙනස් කිරීම/ රස වින්දනය වෙනස් කිරීම/ අපගාමී චර්යාවලට යොමු කිරීම/ ආයෝග්‍ය පුරුදු ඇති කිරීම/ පවුල් ගැටළු වැරදි ආකාරයට තේරුම් ගැනීමට පුරුදු වීම/ පවුල් ගැටළුවල දී ආයෝග්‍ය තීරණ ගැනීම/ සමාජිකයන් අතර සබඳතා පළුදු කිරීම/ සාවද්‍ය සමාජාර්ථ පවුල තුළ ගොඩනැංවීම. (විශේෂාංග ලිපියක ආකෘතිය රචනා කිරීමට ලකුණු 1x4=04 )

(ආකෘතිය නැති විට ලකුණු 1/2 x 4 = 02 පමණි.)

(05) (1) සමාචාර විධි/ ජනශ්‍රැති/ ඇදහිලි / නර්තන / පූජාක්‍රම/ ගිනිමැළ / දුම / හූව/ කොළ අතු එල්ලීම/ බෙර ගැසීම/ නලා පිඹීම/ අභිචාර ක්‍රම / ධජ එසවීම. (ලකුණු 01)

(2) නිවැරදිබව/ නිශ්චිතබව/ කාලෝචිත බව/ සහේතුකව සංවිධානය/ අර්ථාන්විත බව (ලකුණු 02)

(3) වාසි = යහපත් සන්නිවේදන ක්‍රියාවලියක් ඇතිවීම / උසස් මාධ්‍ය සංස්කෘතියක් ඇතිවීම/ සමාජයට හානිදායක තොරතුරු වාරණය වීම.

අවාසි - ග්‍රාහකයා තොරතුරු දැන ගැනීමේ අයිතිය උල්ලංඝනය වීම/ ඒකාධිපති ස්වභාවයක් ඇතිවීම/ සංස්කාරක මත ග්‍රාහකයා පරාරෝපණය වීම. (ලකුණු 03)

(4) නිවැරදි බව/ සමතුලිත බව/ පැහැදිලිබව/ විශ්වසනීයත්වය (ලකුණු 04)

(06) (1) මහජනතාව උනන්දුවක් දක්වන ප්‍රවෘත්ති, වෙළඳ දැන්වීම්, සාහිත්‍ය සම්බන්ධ කරුණු හා අනෙකුත් අංග ඇතුළත්ව දිනපතා හෝ සතිපතා පළ කරන මුද්‍රිත ස්වරූපය (ලකුණු 01)

(2) ඡායාරූපයක ආලෝකය හා අඳුර අතර අනුපාතය පැහැ අන්තරය නම් වේ. (ලකුණු 02)

(3) ප්‍රමාණය / පළවන වාර ගණන/ කේන්ද්‍රීය විෂය/ භාවිත කරන පාඨකයා/ ප්‍රාදේශීය පුවත්පත් (ලකුණු 03)

(4) සම්මුඛ සාකච්ඡා / ප්‍රශ්නාවලි / නිරීක්ෂණය / ලේඛන පරිශීලනය / බුද්ධි කලම්භනය (ලකුණු 04)

(07) (1) යම් රැස්වීමක්, සම්මන්ත්‍රණයක් හෝ තොරතුරු සමූහයක්, විශේෂ පිරිසක් ඉලක්ක කරගෙන සකස් කරන ලේඛනයකි. (ලකුණු 01)

(2) ලිපිය ලැබීම → කවරය කඩා ලිපිය ලබා ගැනීම → දින මුද්‍රා තැබීම → පොදු පොතේ බාර දී අදාළ අංශයට බාරදීම → අංශය බාර ගැනීම → ලිපිගොනුවට ඇතුළත් කිරීම → ...................... නැවත පිළිතුරු ලිපිය තැපැල් කිරීම. (ලකුණු 02)

(3) කාර්ය පහසුවීම/ කාර්යයේ ඵලදායීතාව ඉහළ නැංවීමට/ ග්‍රාහක ආකර්ෂණය වැඩි වීමට/ කරුණු මතකයේ රඳවා ගැනීමට පහසුවීමට/ ශ්‍රව්‍ය-දෘශ්‍ය ලෙස නිරූපණයට හැකිවීම/ දේශන පරිසරය ප්‍රියජනක තැනක් බවට පත් වීම. (ලකුණු 03)


(4) තොරතුරු දැනගැනීමේ පුද්ගල අවශ්‍යතාව / තොරතුරු දැන ගැනීමේ සාමාජීය අවශ්‍යතාව..... නිදසුන් සහිතව විස්තර කළ යුතු ය. (ලකුණු 04)


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


**www.lol.lk**
**Learn Ordinary Level**


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371





































Online shopping

**www.lol.lk**
**Learn Ordinary Level**

DELIVERY ISLANDWIDE

SECURE PAYMENT

# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්














## කෙටි සටහන් පොත්










වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත්
# ගෙදරටම ගෙන්ව ගන්න
# ඔන්ලයින් ඔඩර් කරන්න
# WWW.LOL.LK
# වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA MasterCard DISCOVER NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers

